# නැළවිලි කවි ගයා රසවිඳිමු



දුවේ පුතේ ඉහත රූපයෙන් දැක්වෙන්නේ මව්පියන්ගේ දරු සෙනෙහස පිළිඹිබු කෙරෙන එක් අවස්ථාවකි. ඔබගේ නංගී මල්ලිව නලවන අවස්ථාවක් මතක් කරගන්න. එම අවස්ථාවේදී ඔබේ අම්මා කවි කියනවා ඔබට ඇසී ඇති. එම කවි නැළවිලි කවි ලෙස හදුන්වයි.

**ක්‍රියාකාරකම**

01. පහත කවි දෙක මවගේ උදව් ඇතිව ලයාන්විතව ගායනා කිරීමට පුහුණු වන්න.

දොයි දොයි දොයි දොයිය බබෝ
බයි බයි බයි බයිය බබෝ

නුබෙ අම්මා කොතැන ගියේ
කිරි එරවා එන්ට ගියේ
කිරි මුට්ටිය ගගේ ගියේ
ගඟට උඩින් කොක්කු ගියේ

ලොවේ පුතුන් බොහෝ ඇතා
වඩා නැළෙව්වත් හඩනා
මගේ පුතා එහෙම නැතා
නාඩා නැළවෙන්න පුතා

02. නැළවිලි කවියක් නිර්මාණය කරන්න.